# 10 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය

## ප්‍රජාතන්ත්‍රවාදී පාලනය



අන්තර්ගතය - ඒ.එම්.ආර්.ඩබ්.එස්.අමරතුංග-ගුරු උපදේශක-රත්නපුර කලාපය
සැකසුම -බී.චිරන්තනී කාරියවසම්-කු/මලියදෙව බාලිකා විද්‍යාලය-කුරුණෑගල

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

- මිනිසා ඈත අතීතයේ සිටම තම අවශ්‍යතා සපුරා ගනු ලැබුවේ සාමූහිකව ජීවත් වීම තුලිනි.
- ගෝත්‍රික වශයෙන් වෙන් ව ජීවත් වූ මිනිසා තම අවශ්‍යතා වැඩි වීමත් සමඟ සාමූහිකව කටයුතු කරන්නට පෙළඹුනි.
- රාජාණ්ඩු ක්‍රම,රදළ ආණ්ඩු ක්‍රම වල තිබූ අඩු පාඩු මඟහරවා ගැනීම තුලින් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් නිර්මාණය විය.



- වර්තමාන ලෝකයේ බොහෝ රටවල් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය පිළිගෙන ඇත.
- ශ්‍රී ලංකාව ද එම රටවල් අතරට එකතු වේ.



## ආරම්භය හා ඉතිහාසය

- ග්‍රීසියේ ඇතැන්ස් නුවර පෞර රාජ්‍යයේ පාලනය ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කර ගෙන ඇත.
- පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූයේ පුරවැසි භාෂාවයි.
- පුරවැසි භාෂාවේ දී පාලන කටයුතු සඳහා පුරවැසියන්ගේ කැමැත්ත සෘජුවම බලපා ඇත.



## ඒබ්‍රහම් ලින්කන්

" ජනතාව විසින් ජනතාව උදෙසා පවත්වාගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයයි"

## සිලර්

" සියලු දෙනාටම අයිතිවාසිකම් හිමි වන පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයයි."

ප්‍රජාතන්ත්‍රවාදය

සෘජු ප්‍රජාතන්ත්‍රවාදය

වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය

## සෘජු ප්‍රජාතන්ත්‍රවාදය

රටක ජනතාව එක් ස්ථානයකට රැස් වී ජනතා ගැටළු සාකච්ඡා කර සියලු දෙනාගේ කැමැත්ත මත විසඳුම් සොයා ගන්නා ක්‍රමයකි.මෙහිදී,

- වර්තමාන රාජ්‍ය භූමි ප්‍රමාණයෙන් විශාල වීම.
- සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම.
- ජනගහණය රැස් කර ගත නොහැකි වීම.
- අදහස් පරස්පර වීම.

වැනි ගැටළු ඇති විය හැකිය.

# වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය

සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ක්‍රියාත්මක කිරීමේ දී මතු වූ ප්‍රායෝගික ගැටළු හේතු කොට ගෙන පසු කාලයේ දී මහජනයා වෙනුවෙන් තෝරා ගන්නා නියෝජිතයින් මඟින් රටේ පාලනය ක්‍රියාත්මක කිරීම ආරම්භ විය.මෙය **වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය** ලෙස හැඳින්වේ.

- මුලින්ම මෙය යුරෝපය තුල ක්‍රියාත්මක වී ඇත.

“ **ජනමත විචාරණය** ,වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රට වල ඇතැම් ගැටළු සඳහා විසදුම් සෙවීම් දී සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය භාවිතා වන අවස්ථාවකි ”

## ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

- මහජනතාවගේ කැමැත්ත මත ක්‍රියාත්මක වේ.
- නීති සම්පාදනය නියෝජිතයන්ගේ බහුතර කැමැත්ත මත සිදු කරයි.
- බලය හිමි වන්නේ ජනතාවගේ කැමැත්තෙන් වැඩි නියෝජිත පිරිසක් අයත් පක්ෂයට හෝ කණ්ඩායමටයි.

**ක්‍රියාකාරකම:-**

"ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය හිතකර වේ" යන මැයෙන්
විවාදයක් පවත්වන්න.